මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - 02/2016 (II)

මගේ අංකය: සීපීසී/පීඑස්සී/09/06/02/02
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක : 244, කටුගස්තොට පාර, මහනුවර
2017අගෝස්තු මස ...18... දින

මධ්‍යම පළාතේ
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
සියළුම ආයතන ප්‍රධානීන් වෙත

**මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ට**
**කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා සහන කාලයක් ලබා දීම**

මීට පෙරාතුව මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් සඳහා පොදුවේ අනුගාමී විභාග අවස්ථා හතරක ( 04 ක) සහනයක් පමණක් ලැබී තිබූ අතර, ඊට පසුව පැවති විභාග අවස්ථාවකදී කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වූ විට, වැටුප් වර්ධක විලම්භනය කරන ලදී.

02. ඉන් අනතුරුව, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය මත මාවිසින් 2016.10.14 දින නිකුත් කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - 02/2016 විධිවිධාන පරිදි නියමිත සේවා ව්‍යවස්ථාව හෝ පරිපාටියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පැවැත්වීමට නියමිතව තිබූ කාර්යක්ෂමතා කඩඉම් විභාග අවස්ථා සංඛ්‍යාවට සමාන අනුගාමී විභාග සංඛ්‍යාවක් මගින් සම්පූර්ණ කිරීමට හැකියාව පැවතුනි.

03. එම සහනය හේතුවෙන් අනුගාමී විභාග අවස්ථා හයක් ( 06 ක්) දක්වා වැටුප් වර්ධක විලම්භනය වීමකින් තොරව III ශ්‍රේණියට සහ II වන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමට/ සම්පූර්ණ කර ගැනීමට නිලධාරීන්ට අවස්ථාව හිමිවන බැවින් එම සහන කාලයට අදාළ වැටුප් වර්ධක උපයා ගැනීමට මේ මගින් අවස්ථාව හිමිවනු ඇත.

04. ඒ අනුව, 2004.01.01 දින සිට 2014.06.30 දින දක්වා මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට පත්වූ සහ එම කාලය තුළ II වන ශ්‍රේණියට උසස්වීම් ලැබූ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා ඔවුන්ගේ පත්වීමේ/ උසස්වීමේ දින සිට ඉදිරියට පවත්වන ලද අනුගාමී විභාග අවස්ථා හයක් ( 06 ක්) දක්වා සහන කාලයක් පහත සඳහන් විධිවිධානයන්ට යටත්ව ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කර ඇත.

05. ඉහත දැක්වූ පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම ප්‍රමාද වීම මත වැටුප් වර්ධක විලම්භනය වීම හේතුවෙන්:

i. පරිවාස කාලය දීර්ඝ කර ඇති III ශ්‍රේණියේ නිලධාරීන් ද,
ii. II වන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වීමට නොහැකි වූ නිලධාරීන්ද
iii. ඉහත හේතු මත සාමාන්‍ය කාර්යසාධනය අනුව වූ II වන ශ්‍රේණියේ සහ I වන ශ්‍රේණියේ උසස්වීම නියමිත කාලයට වඩා ප්‍රමාද වී ලැබී ඇති නිලධාරීන් ද

මේ යටතේ සිය විලම්භනය වූ වැටුප් වර්ධක සහ ඒ හේතුවෙන් ප්‍රමාද වූ සාමාන්‍ය කාර්යසාධනය අනුව, වූ II වන සහ I වන ශ්‍රේණියේ උසස්වීම් (2004.01.01 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 11.3 සහ 12.3 වගන්ති යටතේ සඳහන්) **පමණක්** යථාවත් කර ගැනීම සඳහා සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයද සහිත ඉල්ලීමක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතුය.

06. මෙය අතීතයට ද බලපාන පරිදි සිදුකරනු ලබන සහන සැලසීමක් වන හෙයින් පහත සඳහන් කරුණු/ අතීතයේදී අභිමුව අවස්ථා පිළිබඳව කිසියම් පිළියමක් වර්තමානයේදී යෙදිය නොහැකි හෙයින්ද එවැනි කරුණු වලදී ගත් අතීත ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි කටයුතු කළ යුතු හෙයින්ද ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බැලීමට අවකාශ නොමැති බව අවධාරණය කරමි.

i. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමිවූ වෙනත් සේවාවන්ට පිවිසීමට හෝ උසස්වීම් (2004.01.01 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 11.2 සහ 12.2 වගන්ති යටතේ සඳහන්) සඳහා වූ හෝ තරඟ විභාගයන්ට/ සම්මුඛ පරීක්ෂණයන්ට හෝ එවැනි කිසියම් තෝරාගැනීමක් වෙනුවෙන් වූ අවස්ථාවක් සඳහා පෙනී සිටීමේ අවස්ථාවක් අහිමිවීම පිළිබඳව සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා

ii. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ තනතුරු ලැබීමේ අවස්ථාවන් පිළිබඳ සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා

iii. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය වීම හඳුනා නොගෙන/ නොසලකමින් සාවද්‍ය ලෙසින් උසස්වීම හෝ වෙනයම් තරග විභාගයන්ට අයදුම්කර ඉන් සමත්ව සම්මුඛ පරීක්ෂණයේදී හෝ වෙනයම් පසු අවස්ථාවකදී වැටුප් වර්ධකය විලම්භනය හඳුනා ගැනීම හෝ සැලකීම හේතුවෙන් අදාළ උසස්වීම හෝ විභාගයේ ප්‍රතිඵල මත කෙරෙන පත්වීම හෝ වරප්‍රසාදය ලැබීම අත්හිටුවා ඇති නිලධාරීන් විසින් එම අත්හිටවූ පත්වීම/ වරප්‍රසාදය ලබා ගැනීමට ඉදිරිපත් කරන අභියාචනා

07. ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01/2009හි විධිවිධාන යටතේ එදිනට පෙර මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II පන්තියට උසස්වීම් ලද නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වීම සඳහා විභාග අවස්ථා හයක (06ක) සහනයක් ලබා දී ඇති බැවින් එම සහනය ඉක්මවා මෙම චක්‍රලේඛය මගින් ඔවුනට මෙම සහනය හිමි නොවේ.

08. ඔබගේ පහසු අවධානය සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට/ පන්තියට සහ II ශ්‍රේණියට/ පන්තියට අදාළව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා ඇති දිනයන් පහත දක්වා ඇත

| III ශ්‍රේණියට/ පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වූ දිනයන් | II ශ්‍රේණියට / පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වූ දිනයන් | |
|---|---|---|
| | විභාග දිනය | ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01/2009 මගින් පෙරදාතම් කර ඇති දිනය |
| 2007.03.31 | 2007.03.31 | 2005.01.01 |
| 2008.08.30 | 2007.12.08 | 2005.07.31 |
| 2009.07.26 | 2008.10.25 | 2006.01.01 |
| 2010.07.17 | 2009.11.21 | 2006.07.31 |
| 2011.10.01 | 2010.11.13 | 2007.01.01 |
| 2013.01.27 | 2011.12.24 | 2007.07.31 |
| 2014.06.29 | 2013.03.16 | - |
| 2015.09.16 | 2014.05.10 | - |
| | 2015.05.23 | - |

ආර්.එම්.එන්. රත්නායක
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.